තමන් විසින් සමාජගත කරනා භාෂාව සම්බන්ධයෙන් මාධ්‍ය වෙසෙසින්ම සැලකිලිමත් විය යුත්තේ, එම භාෂාව ඔස්සේ සමාජයේ ආකල්ප සහ චින්තනයද හැඩගැස්වෙන බැවිනි. විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය හා සටන් වැද සිටිනා වර්තමානයෙදීද මාධ්‍ය මගින් තමන් භාවිතා කරනා භාෂාව පිළිබඳව සැලකිලිමත් නොවීමේ ආදීනව සම්බන්ධයෙන් අපි නිරන්තරයෙන්ම පෙන්වා දෙන්නෙමු.

මීට උදාහරණයක් ලෙසින් ලංකාදීප පුවත්පතේ සිරස්තලයේ සඳහන් වන "කොරෝනා සුද්දෝ" යන යෙදුම දැක්විය හැක. 'සුද්දා' යන යෙදුම සෘණාත්මකව යෙදෙනා විට නිෂේධනාත්මක නාමකරණයක් වන්නා සේම, 'කොරෝනා සුද්දෝ' වැනි යෙදුමක් කෙතරම් සදාචාරාත්මකද යන ගැටළුවද පැන නගී. කොවිඩ්-19 සහ විදේශිකයින් හා බැඳී ඇති විදේශික භීතිකාවකටද (xenophobia) මෙවැනි යෙදුම් හේතු නොවනු ඇතිද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus #Lankadeepa**